# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,905 — 1970 මැයි 8 වැනි සිකුරාද — 1970.5.8

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 361 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 361 | අය-වැය ලේඛන ... ... ... | 365 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | මාර්ග කොමිටි දැන්වීම ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — | විවිධ දැන්වීම ... ... ... ... | 366 |


## පළාත් පාලන නිවේදන

### ගම්සභා ආඥාපනත

#### 17 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 වැනි අධිකාරයවන) ගම්සභා ආඥාපනතේ 17(5) දරණ වගන්තියෙන් මා කෙරෙහි පැවැරී ඇති බලතල ප්‍රකාර, නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ලේකම්වසම් ගොඩ්වින් සිරිවර්ධන වන ම විසින් 1970 මැයි මස 16 වැනි දින පෙරවරු 10.30 ට කොටගල පිහිටි දිඹුල ගම්සභා කාර්‍යාලයේදී නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයේ දිඹුල ගම් සභාවේ රැස්වීමක් මෙයින් කැඳවා සිටිනු ලැබේ.

එල්. ජී. සිරිවර්ධන,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
නුවරඑළිය පාලන දිස්ත්‍රික්කය.

1970 මැයි මස 8 වැනි දින,
නුවරඑළිය,
පළාත් පාලන අමාත්‍යාංශ කාර්‍යාලයේදීය.

5–156—70.5.8 දින අංක 14,905 දරන ගැසට් පත්‍රය

## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

1 **දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥාපනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 3 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනික් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සමාජිකයන් විසින් උසුලනු ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරු කර හරිනු ලැබුව හොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ 1948 අංක 8 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1954 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥාපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර පළාත් පාලන සේවයට මාරු කරනු ලැබූ දිනයට ඉස්සරින්ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශික බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඇ) ස්ත්‍රීන්ද, වයස 55ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින්ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දැරූ නිලධාරීන්ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාටම, 1952 ජූනි 30 වැනි දිනය හා 10,429 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4ක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දයක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක් මුදලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත් වන්නන්ට නියම කළ හැකිය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත් වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

**4. නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදාළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුර වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැත්නම් අවුරුදු 3ක් වන්නේය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්ය්‍යය සඳහාත් විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝගවලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස " නව ප්‍රවේශක නිලධාරීන්ටත් " නියම කරනු ලැබේ.

(iii) (අ) ස්වකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළතදී සිංහල භාෂාව විෂයෙහි ප්‍රවීණතාවක් ලබාගන්නා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබේ.

(ආ) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම අනිකුත් කරුණු අතර, නියමිත කාල සීමාවන් තුළදී සිංහලය පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමාවන් තුළදී මේ ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමිය හැකි වන අතර, නියමිත කාලසීමාවෙන් පසු වැඩිපුර කාලසීමාවක් ඇතුලතදී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමීම, වැටුප් වැඩිවීම නතර කිරීමක් බවට පරිවර්තනය කරනු ලැබේ. එසේ නතර කිරීම පරීක්ෂණයෙන් සමත් වනතුරු බලපවත්වනු ඇත. (අංක 13,387 සහ 62.11.9 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලන්න).

(ඇ) **අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථය අඩුම සුදුසුකම් වශයෙන් නියම කොට ඇත්තාවූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයකින් සම්මානයක් තිබිය යුතුය.

1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්වවූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියාවූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදාළ නොවේ.

(ඇ) **කාර්යක්ෂමතා කඩයිම.**—පත්වීම් ස්ථිර කරන ලද දිනයේ සිට අවුරුදු 2ක් ඇතුළතදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ සිංහල භාෂාව පිළිබඳ කාර්ය්‍යක්ෂමතා කඩයිම් පරීක්ෂණයකින් සමත් වන ලෙස නව ප්‍රවේශක නිලධාරීන්ට නියම කරනු ලැබිය හැකිය. මේ පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත් වීමේ ප්‍රතිඵලය වනුයේ වැටුප් වැඩිවීම කල් දැමීමය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා ගන්නා " නව ප්‍රවේශක නිලධාරීහු " සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

(v) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී සිංහල ප්‍රවීණතාව පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණිය නොහැකි වුවහොත් අංක 21 සහ 22 දරණ පළාත් පාලන සේවා රෙගුලාසිවල සාමාන්‍ය විධි විධාන බලපවත්වනු ඇත.

(පහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරණ කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදෙයි.)

සටහන 1.—මේ කරුණ සම්බන්ධයෙන් " නව ප්‍රවේශක නිලධාරි " යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන්ය.

සටහන 2.—රජයේ සේවයෙහි නියැලිව සිට පළාත් පාලන සේවයේ තනතුරු භාර ගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නාවූ " ආදි ප්‍රවේශක නිලධාරීන් " කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) (අ), (ආ) සහ (ඇ) හි සඳහන් විධිවිධාන අදළ නොවේ.

**5. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ද, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා " ලාංකික " යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

**6. සේවා මුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවා මුක්තවූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුද සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡෙදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

**7. වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකාම අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරන වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට සුළුවන.

**8. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදගන්නට තමන් සූදානම්ව සිටින්ද නැද්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම් පත්, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්‍යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපැලේදී, ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වන තුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූද ඒ අවදානමට මුහුණ පාති.

අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

## පළාත් පාලන සේවය

සැ.යු.–(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුරු අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු **කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්** වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙලකිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත් අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්වලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදළ වන වෘත්තිය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

———————තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධ කොට ඇති ගැසට් පත්‍රයේ දිනය:————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස අවුරුදු :————. මාස :————, දින :————

(ආ) උපන් දිනය :————

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පියා සහ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙනගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තිය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතන වල නම් :————.

10. ඉගෙන ගත් පාඨශාලා හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) : ————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතනය හා කාලසීමාවන් :————

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රෙණිය හා ඊට පත් වූ දිනය :——.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම් :

සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. **විශෙෂ සුදුසුකම්.**—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද? එසේ නම් ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස්ද? එසේ නැත්නම් ඔබේ ණය බැදීම්වල ප්‍රමාණය කොතෙක් ද?:————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.
(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත් මා නුසුදුස් සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ලේකම්,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැපැල් පෙට්ටිය 530, කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### ජල කර්මාන්ත ඇන්ජින් රියැදුරු තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත්‍ර කැඳවයි.

2. වැටුප.—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය (ඒකාබද්ධ) :—

රු. 2,520—60×17—රු. 3,540 රු. 3,120 වාර්ෂික වැටුපට පළමුව කාර්යක්ෂමතා කඩයිමකි.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) වයස 1970.5.26 වැනි දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවන්ට සෑම වර්ගයකම කුඩා තෙල් ඇන්ජින් හා කේන්ද්‍රාපසාරක පොම්ප ක්‍රියා කරවීමේ හා නඩත්තු කිරීමේ පළපුරුද්ද තිබිය යුතුයි. තෙල් පරිභෝජනය, ලිහිස්සි තෙල් පරිභෝජනය, දිනකට පොම්ප කෙරෙන වතුර ගැලොම් ප්‍රමාණය හා දිනකට පාවිච්චි වන මිශ්‍රද්‍රව්‍ය පිළිබඳ වාර්තා තැබීමටද ඔවුනට හැකිවිය යුතුයි. විට්රි කොලිනෝටර් හැසිර වීම හා ක්ලෝරයින් පරිභෝජනය වන ප්‍රමාණය සටහන් කිරීමට හැකි විය යුතුයි.

ඉහත සඳහන් පළපුරුද්ද හා දැනුම සනාථ කිරීමේ සහතික අයදුම් පත්‍වලට අමුණා එවිය යුතුයි.

4. පහත සඳහන් සුදුසුකම් තිබෙන ඉල්ලුම්කරුවන්ට වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ :—

(i) ඉංග්‍රීසි හා සිංහල 7 වැනි ප්‍රමාණයේ සාමාර්ථය.

(ii) පොම්ප නඩත්තු කිරීමේ අවුරුදු 10 ක පළපුරුද්දක්.

(iii) ජලය පිරිසිදු කිරීමේ පොම්ප ක්‍රියා කරවීමේ හැකියාවක් තිබීම.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම්පත්‍ර පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘතිපත්‍රයට අනුව සාරානුකූලව පිළියෙළ කොට, 1970.5.26 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

7. අයදුම්පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාර දී තිබී, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගත්තා ලෙස නිර්දේශ කළහොත් පමණි.

9. සුදුසු ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

ඩී. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 අප්‍රේල් මස 26 වැනි දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

5–139—70.5.8 දින අංක 14,905 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### වෙළඳ සැල් පරිපාලක තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. **තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 3,000—90×21—4,890 රු. 5,016—144×2—5,304 මෙහි වර්ෂයකට රු. 3,180 හා 4,530 වාර්ෂික වැටුප්වලට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත. නිල ඇඳුම් නොමිලයේ සපයනු ලැබේ. විවාහක නිලධාරීන්ට මීට අමතරව රජයේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ද ගෙවනු ලැබේ.

3. **අවශ්‍ය සුදුසුකම් :—**

(අ) 1970.5.26 වැනි දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි. (පළාත් පාලන සේවයේ නොමැති අයට.)

(ආ) (i) අයදුම්කරුවන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ සිංහල හෝ දෙමළ සහ අංක ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ඊට ඉහළ විභාගයකින් හෝ සමත්ව සිටිය යුතුය.

(ii) වෙළඳ සැල් පරිපාලක තනතුරට අයත් රාජකාරි පිළිබඳ පළපුරුද්දක් ඇති, යටත් පිරිසෙයින් කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් 1955.4.1 දිනට පෙර පළාත් පාලන සේවයට පත්කරන ලද පළාත් පාලන සේවා සාමාජිකයින්ගෙන්ද අයදුම්පත් කැඳවනු ලැබේ.

(ඇ) අයදුම්කරුවන් මනා ශාරීරික පෙනුමක් ඇති අය විය යුතුය.

(ඈ) සිංහල හා දෙමළ කථා ව්‍යවහාරය පිළිබඳව දැනුමක් අයදුම්කරුවන්ට තිබිය යුතුය.

4. තෝරාගනු ලබන අයදුම්කරුවන් පළමුවරට කොළඹ නගර සභාවේ නාගරික සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පත් කරනු ලබන අතර, ඔවුන්ට නගර සීමාව තුළ වාසය කිරීමට නියම කරනු ලැබේ. මුදලින් මුදලින් රු. 50 ක ඇපයක්ද තැබීමට තෝරාගනු ලබන අයට නියම කරනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලන්න.

6. ඉල්ලුම්පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙළ කොට, මා වෙත 1970.5.26 දින හෝ ඊට පෙර ලැබෙන ලෙස එවිය යුතුය.

සදහන් කරන ලද ආකෘති පත්‍රයේ 13 වැනි ඡේදය වෙනුවට පහත සඳහන් කරුණු යොදා ගත යුතුය :—

13 (අ) සෞඛ්‍ය පිළිබඳ ලබා ඇති සුදුසුකම් ඇත් නම්, ඒ පිළිබඳ විස්තර.

(ආ) සෞඛ්‍ය වැඩ කටයුතු සහ කම්කරු පාලනය පිළිබඳ පළපුරුද්ද ඇත් නම්, ඒ පිළිබඳ විස්තර.

(ඉහත සඳහන් (අ) සහ (ආ) සම්බන්ධයෙන් සහතික පත්වල පිටපත් අයදුම්පතට ඇමිණිය යුතුයි.)

7. අයදුම්පත් හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. නියමිත දිනට පසු මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

9. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් පමණක් ලැබුණු බව දන්වනු ලැබේ.

ඩී. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 අප්‍රේල් මස 26 වැනි දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

5–140—70.5.8 දින අංක 14,905 දරන ගැසට් පත්‍රය

# අය - වැය ලේඛන

## මොරටුව නගර සභාව

### අතිරේක අය–වැය ලේඛනය—අංක 1—1970

| වැය ශීර්ෂය | මුදල රු. | ශ. |
|---|---|---|
| ඒ.—(3) ආපසු ගෙවීම් ... ... ... | 250 | 0 |
| බී.—(2) නඩත්තු කිරීම්—නඩත්තු සඳහා ... | 10,960 | 0 |
| බී.—(12) නව කර්මාන්ත ... ... | 30,000 | 0 |
| ඩී.—(4) නඩත්තු කිරීම ... ... | 13,000 | 0 |
| ඊ.—(1) (ජී) කානු සෑදීම ... ... | 25,000 | 0 |
| ඊ.—(5) (බී) ගබඩා ... ... ... | 30,000 | 0 |
| ජේ.—(6) (සී) මාර්ගවල ගස් කැපීම ... ... | 750 | 0 |
| ජේ.—(8) ආපසු ගෙවීම් ... ... | 100 | 0 |
| එකතුව ... | 1,10,060 | 0 |

1970 මාර්තු මස 14 දින, නගර සභා රැස්වීමේ යෝජනා අංක 63 යටතේ සභා සම්මත විය.

ජයසුමන ධර්මබන්ද්‍ු,
මොරටුව නගර සභාවේ සභාපති.

1970 අප්‍රේල් මස 26 වැනි දින,
මොරටුව නගර සභා කාර්‍යාලයේ දීය.

5–142—70.5.8 දින අංක 14,905 දරන ගැසට් පත්‍රය

## බලපිටිය සුළු නගර සභාව

### 1970 අය වැය ලේඛනය

### මුදල් නියෝග 40 (II) යටතේ කෙරෙන අයදුම් පත

1970 අයවැය ලේඛනයේ ඒ ඒ වැය සිරස් යටතේ වෙන් කරන ලද මුදල්වලින් ඉතිරි වේයයි ගණන් බලන ලද පහත පෙනෙන වැය සිරස් යටතේ මුදල් ඊට අනුරූපව දැක්වෙන වැය සිරස්වලට මාරුකර අවශ්‍ය වී තිබෙන අතිරේක වැය සඳහා එම සිරස් යටතේ යෙදවීමට 1970ක් වූ අප්‍රියෙල් මස 7 වන් දින පවත්වන්ට යෙදුන මාසික සභා රැස්වීමේදී අංක 2 (12) දරණ සම්මුතිය අංක යටතේ සභා සම්මත විය.

#### පළමුවන කොටස (සාමාන්‍ය)

| මුදල් ඉතුරු වැය සිරස් | රු. | ශ. |
|---|---|---|
| ඒ.—(1) (ජී) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 8,600 | 0 |
| ඒ.—(1) (එච්) අතුරු දීමනා ... ... | 1,770 | 0 |
| බී.—(13) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 1,525 | 0 |
| බී.—(3) (ඒ) අතුරු දීමනා ... ... | 300 | 0 |
| සී.—(8) ජීවනාධාර, විශේෂ ජීවනාධාර ... ... | 1,100 | 0 |
| සී.—(8) (ඒ) අතුරු දීමනා ... ... | 420 | 0 |
| ඩී.—(2) (ඊ) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 7,000 | 0 |
| ඩී.—(2) (ඊ) (1) අතුරු දීමනා ... ... | 3,360 | 0 |
| ඩී.—(3) (එච්) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 1,865 | 0 |
| ඩී.—(3) (එච්) (1) අතුරු දීමනා ... ... | 840 | 0 |
| ඩී.—(6) (සී) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 4,000 | 0 |
| ඩී.—(6) (සී) (1) අතුරු දීමනා ... ... | 1,150 | 0 |
| ජේ.—(6) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 980 | 0 |
| ජේ.—(6) (ඒ) අතුරු දීමනා ... ... | 420 | 0 |
| එකතුව ... | 33,330 | 0 |

| මුදල් අවශ්‍ය වැය සිරස් | රු. | ශ. |
|---|---|---|
| ඒ.—(1) (ඒ) ලේකම් ... ... ... | 3,444 | 0 |
| ඒ.—(1) (බී) ලිපිකරුවෝ ... ... | 6,005 | 65 |
| ඒ.—(1) (සී) ආදායම් පරීක්ෂක ... ... | 2,164 | 0 |
| ඒ.—(1) (ඩී) කාර්‍යාල කාර්‍ය සහායක ... | 1,909 | 0 |
| ඒ.—(2) (ඒ) දීමනා ... ... | 56 | 90 |
| බී.—(1) (බී) ඕවර්සියර් ... ... | 2,241 | 08 |
| සී.—(1) කුලී ... ... ... | 1,568 | 42 |
| ඩී.—(1) (සී) දීමනා ... ... ... | 180 | 0 |
| ඩී.—(2) (ඒ) කුලී ... ... ... | 12,542 | 01 |
| ඩී.—(3) (ඒ) කුලී ... ... ... | 3,218 | 94 |
| එකතුව ... | 33,330 | 0 |

#### දෙවන කොටස (විදුලිය)

| | රු. | ශ. |
|---|---|---|
| ඊ.එල්.—(10) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 9,568 | 0 |
| ඊ.එල්.—(10) (ඒ) අතුරු දීමනා ... ... | 2,900 | 0 |
| එකතුව ... | 12,468 | 0 |

| | රු. | ශ |
|---|---|---|
| ඊ.එල්.—(4) (ඒ) වැටුප් හා දීමනා (පාලන) ... | 5,172 | 22 |
| ඊ.එල්.—(4) (බී) වැටුප් හා දීමනා (බාහිර) ... | 7,295 | 78 |
| එකතුව ... | 12,468 | 0 |

පී. වයිමන් ද සිල්වා,
සභාපති,
බලපිටිය සුළු නගර සභාව.

1970 අප්‍රියෙල් මස 26 වැනි දින,
සුළු නගර සභා කාර්‍යාලය,
බලපිටිය.

5–145/1—70.5.8 දින අංක 14,905 දරන ගැසට් පත්‍රය

## බලපිටිය සුළු නගර සභාව

### පළමුවන අතිරේක අය-වැය ලේඛනය—1970

### පළමුවන කොටස (සාමාන්‍ය)

| වැය සිරස් | රු. ශ. | ගණන් බලන ලද වියදම් හා සභා සම්මුතිය |
|---|---|---|
| ඩී.—(3) (ජී) ඉදිකිරීම් ... ... | 1,760 0 | ... 1970.1.9 දින අංක 3(1) |
| ඩී.—(7) (බී) නඩත්තු ... ... ... | 250 0 | ... 1970.1.9 දින අංක 3(4) |
| ඒ.—(2) (ඒ) දීමනා ... ... ... | 421 10 | 1970.4.7 දින අංක 2(12) |
| ඒ.—(2) (එච්) ගණකාධිකාරි ගාස්තු ... ... | 186 10 | |
| ඩී.—(6) (ඒ) කුලී ... ... ... | 6,198 60 | |
| ජේ.—(1) වැටුප් ... ... ... | 1,703 32 | |
| | 8,509 12 | |

### දෙවන කොටස (විදුලි)

| වැය සිරස් | රු. ශ. | ගණන් බලන ලද වියදම් |
|---|---|---|
| ඊ.එල්.—(4) (බී) වැටුප් හා දීමනා (බාහිර) ... | 403 30 | ... 1970.4.7 දින අංක |

පී. වයිමන් ද සිල්වා,
සභාපති,
බලපිටිය සුළු නගර සභාව.

1970 අප්‍රියෙල් මස 26 වැනි දින,
සුළු නගර සභා කාර්යාලය,
බලපිටිය.

5–145/2—70.5.8 දින අංක 14,905 දරන ගැසට් පත්‍රය

---

## හපුතලේ පළාත් ආණ්ඩු සභාව

### 1970 වර්ෂයේ පළමුවන පරිපූරක අයවැය ලේඛනය

| වැය ශීර්ෂය | මුදල රු. ශ. | යෝජනා අංකය හා දිනය |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| (4) දීමනා හා ආධාර ... | 250 0... | 1970.2.23 වැනි දින අංක 3 |

| වැය ශීර්ෂය | මුදල රු. ශ. | යෝජනා අංකය හා දිනය |
|---|---|---|
| ඩී.—නගර සභා ඉඩම් හා ගොඩ නැගිලි :— | | |
| (4) නඩත්තු කිරීම් ... | 2,248— 0... | 1970.3.28 වැනි දින අංක 11 |

ඇස්. බී. විල්බට් සිල්වා,
සභාපති,
පළාත් ආණ්ඩු සභාව, හපුතලේ.

1970 අප්‍රේල් මස 26 වැනි දින,
හපුතලේ පළාත් ආණ්ඩු සභා කාර්යාලයේ දීය.

5–143—70.5.8 දින අංක 14,905 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## වේයන්ගොඩ සුළු නගර සභාව

### ජල භීතිකා රෝගය

වේයන්ගොඩ සුළු නගර සභා සීමාව තුල ජලභීතිකා රෝග උවදුරු පවතින බැවින් එම නගර සීමාව තුල පිහිටි පෞද්ගලික ගොඩ නැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ, අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඩාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ, කිසියම් සුනඛයෙකු (බල්ලෙකු හෝ බැල්ලියකු) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවේලේම විනාශ කරනු ලබන බව, (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වෙනි පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥා පණතේ 11 වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශනය කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය ගැසට් පත්‍නි පළවන දින සිට හය මාසයක කාලයක් බලපවත්වනවා ඇත.

ඒ. කේ. ආර්. පෙරේරා,
සභාපති,
වේයන්ගොඩ සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
වේයන්ගොඩ,
1970. 4. 22.

5–1048—70.5.8 දින අංක 14,905 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ—ආඩිඅම්බලම ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පණත

මෙහි පහත විස්තර දක්වෙන මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පණතේ 272 අධිකාරයේ 7 (2) (ඒ) යටතේ දක්වෙන අතර, උපලේඛණයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1970 වර්ෂයට බලපත්‍ර ඉල්ලා මා වෙත අයදුම් පතක් ඉදිරිපත් කර ඇති බව, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධවන ආඩිඅම්බලම ගම්සභා ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් කෙනෙකු වේ නම්, තමා එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් නිසාද යන වග පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වී දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ 272 වන අධිකාරයේ 7 (2) (බී) වන වගන්තිය ප්‍රකාර මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | බලපත්‍රයේ ස්වභාවය |
|---|---|---|---|
| 1. | ඇස්. අන්තෝනි ... | කටුනායක ... | ඌරු මස් වෙළඳාම |

හෙන්රි කරුණාරත්න,
ආඩිඅම්බලම ගම් සභාවේ සභාපති.

1970 අප්‍රේල් මස 12 වැනි දින,
ආඩිඅම්බලම ගම්සභා වේ දී ය.

5–1043—70.5.8 දින අංක 14,905 දරන ගැසට් පත්‍රය

## කළුතර බද්ද ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පණතේ (272 වැනි අධිකාරිය) 17(1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අධිකාර තැනවූ ද, කළුතර බද්ද ගම්සභාවේ සභාපති තැන වූද, ඩී. ලූවිස් සිල්වා වන මම 1970 වර්ෂයේ දී පහත දැක්වෙන උප ලේඛණයේ සඳහන් දින වලදී, කළුතර දිස්ත්‍රික්කයේ කළුතර බද්ද ගම්සභා ප්‍රදේශ සීමාව තුල මස් පිණිස සතුන් මැරීම සහ මස් විකිණීම මෙයින් සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

### උපලේඛනය

ජනවාරි—1, 7, 15, 22, 30.
පෙබරවාරි—4, 6, 14, 17, 21, 28.
මාර්තු—6, 7, 15, 22, 27, 30.
අප්‍රියෙල්—6, 14, 21, 28.
මැයි—5, 13, 18, 20, 21, 28.
ජූනි—4, 12, 19, 26.
ජූලි—3, 11, 18, 25.
අගෝස්තු—1, 9, 16, 23, 31.
සැප්තැම්බර්—8, 15, 22, 29.
ඔක්තෝබර්—4, 7, 14, 22, 29.
නොවැම්බර්—6, 13, 21, 28.
දෙසැම්බර්—5, 12, 20, 27.

ඩී. ලූවිස් සිල්වා,
කළුතර බද්ද ගම්සභාවේ සභාපති.

1970.4.19 දින,
බෝම්බුවල–නාගොඩ,
කළුතර බද්ද ගම්සභා කාර්යාලයේ දී ය.

5–148—70.5.8 දින අංක 14,905 දරන ගැසට් පත්‍රය

---

## මාතර නගර සභාව

### නගර සභා ආඥාපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 162 (1) (බී) සහ 164 වෙනි වගන්ති යටතේ මාතර නගර සභාව විසින් මෙම නිවේදනයට යාකොට ඇති උපලේඛනයේ විස්තර කෙරෙන නිවේදනය ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලවූදා සිට වලංගු වන පරිදි එම උපලේඛනයේ නියමිතව සඳහන් බලපත්‍ර ගාස්තු පනවා ඇති හෙයින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇස්. කේ. පියදාස,
සභාපති,
මාතර නගර සභාව.

1970 මාර්තු 19 වැනි දින,
මාතර නගර සභා කාර්යාලයේ දීය.

### උපලේඛනය

පහත සඳහන් කාර්යයන් සඳහා යම් භූමිභාගයක් හෝ ස්ථානයක් පාවිච්චි කිරීමට බලය පවරන බලපත්‍රය :—

| | රු. | ශ. |
|---|---|---|
| (1) ඔසවනයක් තිබෙන මෝටර් රථ සර්විස් කිරීමේ ස්ථානයක් තබා ගැනීම ... ... | 100 | 0 |
| (2) මෝටර් බයිසිකල් අළුත්වැඩියා කිරීම හෝ සර්විස් කිරීම සඳහා ස්ථානයක් තබා ගැනීම ... | 25 | 0 |
| (3) පැට්‍රල් පිරවීමේ ගබඩාවක් පවත්වා ගෙන යෑම ... | 250 | 0 |
| (4) ඡායාරූප ශාලාවක් පවත්වා ගෙන යෑම .. | 100 | 0 |
| (5) ලියවන පට්ටලයක් සහ කම්මල් ලිපක් සහිතව ගිනියම් කර පෑස්සීමේ යන්ත්‍රයක් තිබෙන්නාවූ මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ වැඩපොළක් පවත්වාගෙන යෑම ... ... | 200 | 0 |
| (6) කම්මල් ලිපක් සහිතව ගිනියම් කර පෑස්සීමේ යන්ත්‍රයක් තිබෙන්නාවූ මෝටර් රථ අළුත් වැඩියා කිරීමේ වැඩ පොළක් පවත්වා ගෙන යෑම ... | 150 | 0 |
| (7) කම්මල් ලිපක් තිබෙන මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ වැඩපොළක් පවත්වාගෙන යෑම ... | 50 | 0 |
| (8) ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ වැඩපොළක් පවත්වා ගෙන යෑම ... ... | 25 | 0 |
| (9) ටයර් සහ ටියුබ් වොල්කනයිස් කිරීමේ වැඩපොළක් පවත්වා ගෙන යෑම ... ... | 10 | 0 |
| (10) බැටරි පිරවීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යෑම | 25 | 0 |
| (11) ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම— | | |
| (i) වර්ග අඩි 500 ට වඩා ඇති ස්ථානයක් සඳහා ... | 100 | 0 |
| (ii) වර්ග අඩි 500 ට අඩු ස්ථානයක් සඳහා ... | 50 | 0 |
| (12) මිනීපෙට්ටි සෑදීම සහ ගබඩා කිරීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යෑම ... ... | 50 | 0 |
| (13) වේවැල් භාණ්ඩ නිෂ්පාදනය කිරීම සහ ගබඩා කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම ... | 25 | 0 |
| (14) වඩු කර්මාන්ත වැඩපොළක් පවත්වාගෙන යෑම ... | 20 | 0 |
| (15) කිසියම් වර්ගයක යන්ත්‍ර පාවිච්චියට ගනු ලබන ලී ඉරන මෝලක් පවත්වාගෙන යෑම ... | 150 | 0 |
| (16) බෙලෙක් වැඩපොළක් පවත්වා ගෙන යෑම ... | 5 | 0 |
| (17) මුද්‍රණාලයක් පවත්වා ගෙන යෑම ... ... | 50 | 0 |
| (18) ලී ගබඩාකර තැබීම සඳහා ගබඩාවක් හෝ අංගනයක් පවත්වා ගෙන යෑම ... ... | 50 | 0 |
| (19) දර ගබඩා කර තැබීම සඳහා ගබඩාවක් හෝ අංගනයක් පවත්වාගෙන යෑම ... ... | 10 | 0 |
| (20) ගැලුම් 1,000 ඉක්මවන ගබඩා ධාරිතාවක් තිබෙන භූමිතෙල් ගබඩාවක් පවත්වා ගෙන යෑම ... | 100 | 0 |
| (21) ගැලුම් 1,000 ඉක්මවන ගබඩා ධාරිතාවක් තිබෙන ඩීසල් තෙල් ගබඩාවක් පවත්වා ගෙන යෑම ... | 100 | 0 |
| (22) පොල් ලෙලි පෙගවීම සඳහා වර්ග අඩි 100 ට වැඩි පොල් ලෙලි වළක් තබා ගැනීම ... | 1 | 0 |
| (23) මාළු ජාඩිලෑම හෝ කරවල ලෙස වේලීම හෝ අයිස් දැමීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යෑම ... | 100 | 0 |
| (24) හාල් කෙටීම, පෙලීම සහ නිවුඩු හැරීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යෑම— | | |
| (i) අශ්වබල 15 කට අඩු ස්ථානයක් සඳහා ... | 100 | 0 |
| (ii) අශ්වබල 15-25 අතර ස්ථානයක් සඳහා ... | 150 | 0 |
| (iii) අශ්වබල 25 වැඩි ස්ථානයක් සඳහා ... | 250 | 0 |
| (25) මිරිස් සහ තුනපහ ඇඹරීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යෑම ... ... | 25 | 0 |
| (26) කම්මලක් හෝ කම්මල් ලිපක් පවත්වා ගෙන යෑම | 5 | 0 |
| (27) ස්වර්ණාභරණ සෑදීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යෑම ... ... | 25 | 0 |
| (28) විදුලි කර්මාන්ත වැඩ පොළක් පවත්වා ගෙන යෑම | 10 | 0 |
| (29) කුරුඳු ගබඩා කිරීම ... ... | 200 | 0 |
| (30) පැඟිරි තෙල් ගබඩා කිරීම ... ... | 150 | 0 |
| (31) සිමෙන්ති කොට්ට 100 ට වඩා ගබඩා කිරීම ... | 50 | 0 |
| (32) පේන්ට් සහ වාර්නිෂ් ගබඩා කිරීම ... | 50 | 0 |
| (33) පුන්නක්කු හෝ වෙනත් සත්ව ආහාර රාත්තල් 100 ට වඩා ගබඩා කිරීම ... ... | 25 | 0 |
| (34) දුම්කොළ මිටි හෝ සිප්පත් 20 ට වඩා ගබඩා කිරීම | 30 | 0 |
| (35) හිස් බෝතල් ගබඩා කිරීම ... ... | 10 | 0 |
| (36) හිස් ගෝනි ගබඩා කිරීම ... ... | 50 | 0 |
| (37) පැරණි ලෝහ ගබඩා කිරීම ... ... | 50 | 0 |
| (38) තොග වශයෙන් විකිණීම පිණිස නරක් වන සුළු ආහාර වර්ග ගබඩා කිරීම— | | |
| (i) තොග වශයෙන් ... ... | 100 | 0 |
| (ii) සිල්ලර වශයෙන් ... ... | 20 | 0 |
| (39) ඇසිටික් ඇසිඩ් ගබඩා කිරීම ... | 25 | 0 |
| (40) මෙතිල් සාත හා ස්ප්‍රිතු ගබඩා කිරීම ... | 25 | 0 |
| (41) අඟුරු ගබඩා කිරීම ... ... | 15 | 0 |
| (42) කපු හෝ කොට්ට පුළුන් ගබඩා කිරීම ... | 5 | 0 |
| (43) සත්වයින්ගේ හම් සහ කටු ගබඩා කිරීම ... | 15 | 0 |
| (44) හුණු සහ හුණු ගල් ගබඩා කිරීම හෝ පිළිස්සීම ... | 10 | 0 |
| (45) සබන් සෑදීම ... ... | 50 | 0 |
| (46) ක්‍රේප් රබර් සහ ෂීට් රබර් නිෂ්පාදනය කිරීම ... | 50 | 0 |
| (47) යන්ත්‍ර මාර්ගයෙන් තේ සෑදීම ... ... | 50 | 0 |
| (48) විනාකිරි සෑදීම ... ... | 50 | 0 |
| (49) යන්ත්‍ර මගින් පොල්තෙල් සෑදීම ... | 200 | 0 |
| (50) කපාපු පොල් සෑදීම ... ... | 100 | 0 |
| (51) කොප්පරා සෑදීම ... ... | 10 | 0 |
| (52) සුරුට්ටු සෑදීම ... ... | 50 | 0 |
| (53) බීඩි සෑදීම ... ... | 10 | 0 |
| (54) කෘතිම පොහොර සෑදීම ... ... | 200 | 0 |
| (55) රෙදි ඩයි දැමීමේ සහ බ්ලීච් කිරීමේ ආයතනයක් ගෙන යෑම ... ... | 25 | 0 |

| | රු. | ශ. |
|---|---|---|
| (56) ලැලි පොඟවා සකස් කිරීම ... ... | 25 | 0 |
| (57) යන්ත්‍ර මගින් ගල් කැඩීම ... ... | 100 | 0 |
| (58) කබුක් ගල්, බොරළු හෝ කළුගල් ලබා ගැනීමට ගල් වලවල් කැනීම ... ... | 10 | 0 |
| (59) යන්ත්‍ර මාර්ගයෙන් කෙඳි වර්ග හෝ කොහු ලණු නිෂ්පාදනය කිරීම ... ... | 10 | 0 |
| (60) පැණි ගබඩා කිරීම ... ... | 10 | 0 |
| (61) බේකරියක් පවත්වා ගෙන යෑම ... ... | 50 | 0 |
| (62) නේවාසික සැප පහසුකම් සහිත හෝටලයක් පවත්වා ගෙන යෑම ... ... | 150 | 0 |
| (63) නේවාසික සැපපහසුකම් නැති හෝටලයක් පවත්වා ගෙන යෑම ... ... | 100 | 0 |
| (64) ලැගුම්හලක් පවත්වා ගෙන යෑම ... ... | 50 | 0 |
| (65) බත් කඩයක් පවත්වා ගෙන යෑම ... ... | 50 | 0 |
| (66) තේ කඩයක් පවත්වා ගෙන යෑම ... | 25 | 0 |
| (67) භෝජනාගාරයක් පවත්වා ගෙන යෑම ... | 75 | 0 |
| (68) සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යෑම | 250 | 0 |
| (69) අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යෑම ... | 150 | 0 |
| (70) කරනවෑම් මැදිරියක් හෝ බාබර් සාප්පුවක් පවත්වා ගෙන යෑම ... ... | 50 | 0 |

5–144—70.5.8 දින අංක 14,905 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥා පනත (257) වැනි අධිකාරය

### අනුරාධපුරය දිස්ත්‍රික්කයේ—කහටගස්දිගිලිය ගම්සභාව

අනුරාධපුර දිස්ත්‍රික්කයේ කහටගස්දිගිලිය ගම්සභාව මගින් පහත සඳහන් යෝජනාව 1970.3.18 දින පවත්වන ලද රැස්වීමේදී සම්මත කර ගන්නා ලද බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්. ඇම්. පියදස උඩුල්දෙනිය,
සභාපති,
කහටගස්දිලිය ගම්සභාව.

1970 අප්‍රේල් මස 22 වැනි දින,
කහටගස්දිගිලිය ගම්සභා කාර්යාලයේදීය.

### යෝජනාව

1952 කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා ආඥා පණතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කහටගස් දිලිය ගම්සභාව විසින් 1970 ක්වූ අප්‍රේල් මස 10 වැනි දින අංක 14,901 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ (IV වැනි කොටස) පල කරන ලද යෝජනාවෙන් සම්මත කරගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 4 වැනි කාණ්ඩයේ 1 වැනි අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර මෙහි පහත සඳහන් මංමාවත් එකිනෙක ඉදිරියෙන් සඳහන් දිග හා පළල අනුව සාද හෝ නැවත සාද පවත්වාගෙන යනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

| කොට්ඨාශ අංකය | පාරේ නම | පටන්ගන්නා ස්ථානය | අවසානවන ස්ථානය | දිග සැ. | දම්. | පළල අඩි |
|---|---|---|---|---|---|---|
| 1. කන්හිදිගම | (1) මදයාකඩවල-වලහවිද්ද වැව පාර | අනුරාධපුර-ත්‍රිකුණාමල ප්‍රධාන පාර | වලහවිද්දවැව ගම්මායිම ... | 4 | 0 ... | 30 |
| | (2) පහලකන්හිදිගම-කිරිඉබ්බෑව පාර | පහලකන්හිදිගම ගම, ඉහල කන්හිදිගම ගම හරහා පාන්බට්ටියාගම හරහා | කිරිඉබ්බෑව ගම් මායිම ... | 3 | 0 ... | 30 |
| | (3) පහල කන්හිදිගම-කහටගස් දිගිලිය පාර | පහල කන්හිදිගම, ඉහලකන්හිදිගම ගම හරහා, පාන්බට්ටියාගම ගම හරහා | කහටගස්දිලිය ගම ... | 2 | 40 ... | 30 |
| | (4) අඹගහවැව-කිරිඉබ්බෑව පාර | අඹගහවැව ගම, පාන්බට්ටියාගම ගම හරහා | කිරිඉබ්බෑව ගම් මායිම ... | 2 | 0 ... | 30 |
| | (5) පහල කන්හිදිගම-රඹාවැව පාර | පහලකන්හිදිගම ගම-නිකවැව හරහා | රඹාවැව ගම් මායිම ... | 1 | 0 ... | 30 |
| | (6) පහල කන්හිදිගම-අමුනු වැටිය පාර | පහල කන්හිදිගම ගම ... | අමුනුවැටිය මායිම ... | 1 | 40 ... | 30 |
| 2. නයාකාපුවැව ... | (1) කැබිතිගොල්ලෑව පාර සිට මදයාකඩ පාර | කැබිතිගොල්ලෑව ප්‍රධාන මාර්ගය ... | නයාකාපු වැව හරහා මදයාකඩ ගම් මායිම | 2 | 40 ... | 30 |
| | (2) කන්හිදිගම-ගල්කන්දේගම පාර | කන්හිදිගම ගම්මායිම ... | ගල්කන්දේගම ගම් මායිම | 0 | 60 ... | 30 |
| | (3) නයාකාපුවැව-නෙලුගොල්ලෑ කඩ පාර | නයාකාපුවැව ගම ... | නෙලුගොල්ලෑකඩ ගම ... | 0 | 60 ... | 30 |
| | (4) නයාකාපුවැව ගංගොඩ පාර | නයාකාපුවැවගංගොඩ ... | ගල්වැව ... | 0 | 20 ... | 30 |
| 3. දිගන්හල්මිල්ලෑව ... | (1) දිගන්හල්මිල්ලෑව-ගංගොඩ පාර | කහටගස්දිගිලිය-කයිනාට්ටම ප්‍ර.වැ.දෙ. පාර | දිගන්හල්මිල්ලෑව ගම් මායිම | 0 | 40 ... | 30 |
| | (2) කනුමුල්ලා ඇල පාර ... | දිගන්හල්මිල්ලෑව වැවප්‍රධාන පාර... | සංදිකවැව ගම්මායිම ... | 1 | 0 ... | 15 |
| | (3) මීගහදිගිලිය පාර—නෙලු... ගොල්ලෑකඩහරහා | කහටගස්දිගිලිය–කයිනාට්ටම ප්‍ර. වැ. දෙ. පාර | මීගහදිගිලිය ගම්සභාව මායිම ... | 2 | 0 ... | 30 |
| | (4) කටුවරවැව පාර ... | කහටගස්දිගිලිය-කයිනාට්ටම ප්‍ර. වැ. දෙ. පාර | කටුවරවැව ... | 3 | 0 ... | 30 |
| | (5) දිගන්හල්මිල්ලෑව-පලුකෙටු වැව පාර | දිගන්හල්මිල්ලෑව ගම ... | පලුකෙටුවැව ගම්මායිම ... | 1 | 40 ... | 30 |
| | (6) දිගන්හල්මිල්ලෑව අලුත් ගංගොඩ පාර | අලුත් ගංගොඩ ... | කහටගස්දිගිලිය-කයිනාට්ටම පාර | 0 | 40 ... | 30 |
| | (7) දිගන්හල්මිල්ලෑව-මීගහදිගිලිය පිටපාර | දිගන්හල්මිල්ලෑව ගම ... | මීගහදිගිලිය ගම් මායිම ... | 1 | 0 ... | 20 |
| | (8) දිගංහල්මිල්ලෑව-මීගහදිගිලිය වැව හරහා පාර | දිගන්හල්මිල්ලෑව ගම ... | මීගහදිගිලිය ගම් මායිම ... | 1 | 0 ... | 20 |
| | (9) නෙලුගොල්ලෑකඩ-දහනක් වැව පාර | නෙලුගොල්ලෑකඩ ගම ... | දනහන්වැව ගම් මායිම ... | 1 | 0 ... | 30 |
| | (10) අලුත්ගම්ගොඩ - සංදික වැව පාර | අලුත්ගංගොඩ ... | සංදිකවැව ... | 1 | 0 ... | 30 |
| | (11) නෙලුගොල්ලෑකඩ-තම්මැන් නාගොඩ පාර | නෙලුගොල්ලෑකඩ ... | තම්මැන්නාගොඩ ගම් මායිම | 3 | 0 ... | 30 |

| කොට්ඨාශ අංකය | පාරේ නම | පටන්ගන්නා ස්ථානය | අවසානවන ස්ථානය | දිග සැ. | දම්. | පළල අඩි |
|---|---|---|---|---|---|---|
| 4. කිරිඉබ්බෑව | (1) කිරිඉබ්බෑව ගම් පාර | කැබිතිගොල්ලෑව ප්‍රධාන පාර | කිරිඉබ්බෑව ගම් මායිම | 1 | 40 | 30 |
| | (2) කිරිඉබ්බෑව පරණ ගම් පාර | එම | කිරිඉබ්බෑව පරණ ගම් මායිම | 0 | 40 | 30 |
| | (3) කුරුක්කුරාගම පාර | එම | තයාකාපුවැව හන්දිය | 1 | 0 | 30 |
| | (4) කුලුම්මාකඩ පාර | එම | කුලුම්මාකඩ ගම්මායිම | 2 | 0 | 20 |
| | (5) කිරිඉබ්බෑව වැව පාර | එම | කිරිඉබ්බෑව වැව | 0 | 40 | 20 |
| | (6) කුරුක්කුරාගම-රෙටවැව පාර | කුරුක්කුරාගම වැව වාන | රොටවැව ගම්මායිම | 0 | 20 | 20 |
| | (7) කුරුක්කුරාගම-කොන්තියා ගම් පාර | කැබිතිගොල්ලෑව ප්‍රධාන පාර | කොන්තයාගම ගම්මායිම | 0 | 40 | 20 |
| | (8) ඉහලකන්හිදිගම පාර | එම | ඉහලකන්හිදිගම ගම්මායිම | 1 | 40 | 20 |
| 5. මහමැස්සලෑව | (1) කොක්මඩුව පාර | අනුරාධපුර-ත්‍රිකුණාමල ප්‍රධාන පාර | කොක්මඩුව ගම් මායිම | 1 | 40 | 30 |
| | (2) වටරක්වැව පාර | එම | වටරක්වැව දියගිල්ම | 0 | 40 | 30 |
| | (3) වටරක්වැව ගංගොඩපාර | එම | වටරක්වැව ගම්මැද්ද හරහා ගම්මායිම, වටරක්වැව | 1 | 0 | 30 |
| | (4) වටරක්වැව ගංගොඩ පුරාණ වෙල පාර | වටරක්වැව ගංගොඩ | පුරාණ වෙල | 0 | 40 | 30 |
| | (5) පුහුදිවුල ගංගොඩ පාර | අනුරාධපුර-ත්‍රිකුණාමල ප්‍රධාන පාර | පුහුදිවුල ගම් මායිම | 1 | 0 | 30 |
| | (6) බෙත්කැව පාර | එම | බෙත්කැව ගම් මායිම | 1 | 0 | 30 |
| | (7) කුඩා මැස්සලෑව-ගංගොඩ පාර | කහටගස්දිලිය-කයිනාට්ටම ප්‍රධාන ප්‍රධාන පාර | නාම්බාකඩ ගම් මායිම | 3 | 0 | 30 |
| | (8) කුඩා මැස්සලෑව සුසානභූමිය පාර | එම | කුඩා මැස්සලෑව සුසාන භූමිය | 0 | 40 | 30 |
| 6. පලුකෙටුවැව | (1) මහ මැස්සලෑව පාර | පලුකෙටුවැව ගම | අනුරාධපුර-ත්‍රිකුණාමල ප්‍රධාන පාර | 1 | 40 | 30 |
| | (2) වම්බටුවාගම පාර | කයිනාට්ටම පාර | පලුකෙටුවැව ගම හරහා වම්බටුවාගම ගම | 1 | 40 | 30 |
| | (3) මහ මැස්සලෑව ගංගොඩපාර | එම | මහමැස්සලෑව ගම් කෙළවර මායිම | 1 | 0 | 30 |
| | (4) පංසල පාර | දිගන්හල්මිල්ලෑව ගම් මායිම | අනුරාධපුර-ත්‍රිකුණාමල පාර | 2 | 0 | 30 |
| | (5) පලුකෙටුවැව පාර | කහටගස්දිගිලිය-කයිනාට්ටම ප්‍රධාන පාර | පලුකෙටුවැව ගම | 1 | 0 | 30 |
| 7. කහටගස්දිගිලිය නගරය | (1) කිරලාගල පාර | කහටගස්දිගිලිය-කයිනාට්ටම පාර | මහා විද්‍යාලය අසලින් කොන්වැව පාර | 1 | 0 | 30 |
| | (2) පල්ලිය පාර | මුස්ලිම් පල්ලිය අසලින් | ගම හරහා කහටගස්දිගිලිය-කයිනාට්ටම පාර | 0 | 40 | 20 |
| | (3) ස්ටෝරු පාර | කහටගස්දිගිලිය- ත්‍රිකුණාමල පාර | කිරලාගල පාර | 0 | 20 | 30 |
| | (4) ගංගොඩ පාර | ස්ටෝරුපාර-බාරොන් මුදලාලිගේ ගෙය අසලින් | කහටගස්දිගිලිය-කයිනාට්ටම ප්‍රධාන පාර | 0 | 40 | 30 |
| 8. කහටගස්දිගිලිය ගම්මැද්ද | (1) කොක්මඩුව හන්දිය-පාන් බට්ටියාගම පාර | කහටගස්දිගිලිය කැබිතිගොල්ලෑව පාර, කොක්මඩුව හන්දිය | පයන්බට්ටියාගම ගම | 2 | 0 | 30 |
| | (2) කහටගස්දිගිලිය වැව පාර | කහටගස්දිගිලිය-කැබිතිගොල්ලෑව ප්‍රධාන පාර | කහටගස්දිගිලිය වැව | 0 | 20 | 30 |
| | (3) කොක්මඩුව පාර | කහටගස්දිගිලිය - කැබිතිගොල්ලෑව ප්‍රධාන පාර, කොක්මඩුව හන්දිය | කොක්මඩුව ගම් මායිම | 0 | 40 | 30 |
| | (4) කහටගස්දිගිලිය-පුරාණ අක්කර පාර | කහටගස්දිගිලිය - කැබිතිගොල්ලෑව ප්‍රධාන පාර | ගම්මැද්ද හරහා පුරාණ අක්කර දක්වා | 0 | 40 | 20 |
| 9. නිකවැව | (1) නිකවැව පාර | කහටගස්දිගිලිය-කයිනාට්ටම ප්‍රධාන පාරේ පහේ (5) කණුව ලගින් | නිකවැව ගම හරහා ඇල්ල වැව හන්දිය | 3 | 0 | 30 |
| | (2) නිකවැව විද්‍යාලය පාර | නිකවැව රජයේ විද්‍යාලයේ ඉඩම | ඇල්ලවැව පාර | 0 | 60 | 30 |
| | (3) නිකවැව වේරගල පාර | නිකවැව ගම | වේරගල ගම | 2 | 0 | 20 |
| | (4) වේරගල-ඔලුකලගල පාර | වේරගල | ඔලුකලගල ගම් මායිම | 1 | 0 | 20 |
| | (5) ඔලුකලගල-දූනුමඩලාව පාර | ඔලුකලගල ගම | දූනුම්ඩලාව ගම | 1 | 0 | 20 |
| | (6) නිකවැව-කෝන්වැව පාර | නිකවැව ගම | කෝන්වැව ගම හරහා කයිනාට්ටම පාර | 2 | 0 | 30 |
| | (7) නිකවැව-දහනක්වැව පාර | එම | දහනක්වැව ගම් මායිම | 1 | 40 | 30 |
| | (8) නෙලුගොල්ලෑකඩ-මුකිරියාව පාර | නෙලුගොල්ලෑකඩ ගම් මායිම | මුකිරියාව ගම | 2 | 0 | 30 |
| | (9) දහනක්වැව-දූනුමඩලාව පාර | දහනක්වැව ගම | දූනුමඩලාව ගම් මායිම | 2 | 0 | 30 |
| | (10) නෙලුගොල්ලෑකඩ-මීගහදිගිලිය පාර | නෙලුගොල්ලෑකඩ ගම්මායිම | මීගහදිගිලිය ගම් මායිම | 2 | 0 | 30 |
| | (11) දහනක්වැව-කටුවරවැව පාර | දහනක්වැව ගම | කටුවරවැව ගම | 1 | 0 | 20 |
| | (12) මීගහදිගිලිය-පොතාන පාර | මීගහදිගිලිය ගම | පොතාන ගම මායිම | 1 | 40 | 30 |
| | (13) මීගහදිගිලිය-රත්මලේ පාර | එම | රත්මලේ ගම් මායිම-ගම් සහා සීමාව | 1 | 40 | 30 |
| | (14) මීගහදිගිලිය-දිගංහල්මිල්ලෑව පාර | එම | දිගන්හල්මිල්ලෑව ගම් මායිම | 0 | 40 | 30 |
| 10. කයිනාට්ටම | (1) උලගල්ල පාර | කයිනාට්ටම හන්දිය | උලගල්ල කෝරලේ පෙරිය කුලම අඹගහ වැව ගම් මායිම | 3 | 0 | 40 |
| | (2) පුලියන්කුලම පාර | කයිනාට්ටම ගම | කුඩා කැලෑගම ගම් මායිම | 1 | 40 | 40 |
| | (3) හිඹුටුගොල්ලෑව පංසල පාර | පුලියන්කුළම පාර | හිඹුටුගොල්ලෑව කුරපයියාව පාර | 1 | 0 | 40 |

| කොට්ඨාශ අංකය | පාරේ නම | පටන්ගන්නා ස්ථානය | අවසානවන ස්ථානය | දිග සැ. | දම. | පළල අඩි |
|---|---|---|---|---|---|---|
| | (4) කරකොල වැව පාර ... | උඩුල්දෙනිය විද්‍යාලය අසළින් ... | කරකොලවැව හරහා කටු කැලියාව ගම් මායිම | 3 | 0 | ... 40 |
| | (5) පන්සලේ සිට පෙරියකුලම පාර | හිඹුටුගොල්ලෑව පංසල ... | උලගල්ල පාර ... | 1 | 0 | ... 40 |
| | (6) හිඹුටුගොල්ලෑව-කරකොල වැව පාර | හිඹුටුගොල්ලෑව ගම ... | උලගල්ල පාර කරකොල වැව ගම | 1 | 40 | ... 40 |
| | (7) කුඩා කැලෑගම පාර ... | සිප්පුකුලම-ගලෙන්බිඳුනුවැව ප්‍රධාන පාර | කුඩා කැලෑගම ගම් මායිම | 3 | 0 | ... 40 |
| 11. කුඩාකැලෑගම ... | (1) තාඹරගල පාර ... | කහටගස්දිගිලිය-කයිනාවිටම ප්‍රධාන පාර | තාඹරගල වැව ... | 0 | 60 | ... 30 |
| | (2) කෝන්වැව ගම්පාර ... | එම ... | කෝන්වැව ගම් මායිම ... | 0 | 40 | ... 30 |
| | (3) උල්පත්වැව පාර ... | එම ... | උල්පත්වැව ගම් මායිම ... | 0 | 60 | ... 30 |
| | (4) කුඹුක්වැව කොළනිය පාර | කයිනාවිටම-පුලියන්කුලම පාර ... | කුඹුක්වැව කොළනිය ... | 1 | 40 | ... 30 |
| | (5) කුඩා කැලෑගම පාර ... | කයිනාවිටම-පුලියන්කුළම පාර ... | කුඩාකැලෑගම ගම්මායිම... | 0 | 60 | ... 30 |
| | (6) කඹරගල-නිකවැව පාර ... | කබරගල වැව ... | නිකවැව ගම් මායිම ... | 0 | 60 | ... 30 |
| | (7) කෝන්වැව-තිබිරිවැව පාර | කෝන්වැව ගම් මායිම ... | තිබිරිවැව ගම්මායිම ... | 1 | 0 | ... 30 |

5—138—70.5.8 දින අංක 14,905 දරන ගැසට් පත්‍රය

## ගම්සභා ආඥාපනත

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා ආඥාපනතේ (2) වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිතුමා විසින් සම්පාදනය කරන ලදුව, 10,517 සහ 10.4.53 දින දරණ ලංකා ආණ්ඩුවේ ගැසට්පත්‍රයේ පළ වූ අතුරුව්‍යවස්ථා යටිනුවර මැද පළාත ගම් සභාව විසින් එකී ආඥාපනතේ (3) වෙනි වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ අංක 10,704 සහ 5.6.54 දින දරණ ගැසට් පත්‍රයේ පළකළ දැන්වීමෙන් පිළිගෙන 1961 අංක 60 දරණ සහ 25.1.63 දින දරණ ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වන කාණ්ඩයේ පළාත් පාලන කොටසේ පළ කරන ලද අංක 37 යටතේ පහත නම් සඳහන් පාර ඇතුළත් කරනු ලැබේ.

1. ඇස් සැද් දුමේ-ඇලවේල්ල (කොළඹ-නුවර) පාරේ සැ. 65 කනුව ළඟ බෝක්කුවේ ඇලවේල්ල අසළින් පටන් ගෙන නානුඹය දක්වා යන පාර, දිග: දැම්වැල් 16, අඩි 44, පළල අඩි 3 යි.

එච්. පී. බී. වීරසේකර,
සභාපති,
යටිනුවර මැද පළාත ගම්සභාව.

ගම්සභා කායසීලය, ඇබිල්මිගම,
පිළිමතලාව, 1970.4.19.

5–136—70.5.8 දින අංක 14,905 දරන ගැසට් පත්‍රය

## වැලිමඩ උප නගර සභාව

### ජල භීතිකා රෝගය

වැලිමඩ උප නගර සභා සීමාව තුළ ජල භීතිකා රෝග උවදුර පවතින හෙයින්, එම නගර සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩ නැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ, අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන, දඩාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ හෝ කිසියම් සුනඛයෙකු (බල්ලෙකු හෝ බැල්ලියක) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවෙලේම විනාශ කරනු ලබන බව (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වැනි පරිජේදය වන) ජලභීතිකා ආඥාපනතේ 11 වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශය, ගැසට් පත්‍රයේ පළවන දින සිට ඉදිරියට මාස හයක (6) කාලයක් වලංගු වේ.

පර්සි සමරවීර,
සභාපති.

1970 අප්‍රියෙල් මස 12 වැනි දින,
වැලිමඩ,
උප නගර සභා කාර්යාලයයේ දීය.

5–146—70.5.8 දින අංක 14,905 දරන ගැසට් පත්‍රය

## රත්නපුර මහ නගර සභාව

### ජල භීතිකා රෝගය

රත්නපුර මහනගර සභා සීමාව තුළ ජලභීතිකා රෝගය පවතින බැවින් එම මහනගර සභා සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩ නැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොපවත්නා වූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඩාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දා වූ හෝ දක්කා ගෙන නොයනු ලබන්නා වූ, කිසියම් සුනඛයකු (බල්ලකු හෝ බැල්ලියක) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවෙලෙහිම විනාශ කරනු ලබන බව (ලංකා ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වෙනි පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥාපනතේ 11 වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශය කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය, ගැසට් පත්‍රි පළවන දින සිට හය මාසයක කාලයක් බලපවත්වනවා ඇත.

උපාලි රාජපක්ෂ,
රත්නපුර නගරාධිපති.

1970 අප්‍රේල් මස 10 දින,
රත්නපුර,
මහනගර සභා කාර්යාලයේදීය.

5–1084—70.5.8 දින අංක 14,905 දරන ගැසට් පත්‍රය

ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

**(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)**

**1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දිනවලට පෙර දින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

**5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත " පිටපත " **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

**7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 20 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

**11. සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ " ගැසට් " පත්‍රය පළකරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

**12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළු දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

13. 68.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. ශ. | | පිටරට රු. ශ. |
|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 0 | ... | 60 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 36 0 | ... | 42 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 43 50 | ... | 51 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුලත දී එක කොටසක් ... ... | 0 50 | ... | 0 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් | 1 00 | ... | 0 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 30 | ... | 0 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 60 | ... | 0 15 |

**දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් ප්‍රමාදවූ ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

**1970**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| අප්‍රේල් | ... 70. 4. 3 සිකුරාද | ... | 70. 3.25 බදාදා | ප.ව. | 3.30 |
| | 70. 4.10 සිකුරාද | ... | 70. 4. 3 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.17 සිකුරාද | ... | 70. 4. 8 බදාදා | ප.ව. | 3.30 |
| | 70. 4.24 සිකුරාද | ... | 70. 4.17 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.30 බ්‍රහස්පතින්දා | ... | 70. 4.23 බ්‍රහස්පතින්දා | ප.ව. | 3.30 |
| මැයි | ... 70. 5. 8 සිකුරාද | ... | 70. 4.30 බ්‍රහස්පතින්දා | ප.ව. | 3.30 |
| | 70. 5.15 සිකුරාද | ... | 70. 5. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.22 සිකුරාද | .. | 70. 5.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.29 සිකුරාද | ... | 70. 5.22 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූනි | .. 70. 6. 5 සිකුරාද | ... | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්දා | .. | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්දා | .. | 70. 6.11 බ්‍රහස්පතින්දා | පෙ.ව. | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්දා | ... | 70. 6.18 බ්‍රහස්පතින්දා | පෙ.ව. | 12.0 |

1970 මාර්තු 5 වැනි දින.
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.